# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## දැන්වීමයි

මගේ අංකය: මාසකො/විධා/01/19(ii)

පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති තම තනතුරේ ස්ථිර වූ මෙම අධිකාරියේ සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**<u>තනතුර: අධිකාරී ඉංජිනේරු (සිවිල්) - SLM 3</u>**

**I.** වැටුප් කාණ්ඩය : **SLM 3**

මූලික වැටුප රු. 109,215/=

වැටුප් වර්ධකය රු. 1,945/=

**II.** **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ පූර්ණ වෘත්තීය සුදුසුකම් සමඟ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් සිවිල් ඉංජිනේරු උපාධියක් හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙන් ඊට සමාන සුදුසුකමක් ලබා තිබීම

**සමඟ**

පළපුරුද්ද :

වරාය අධිකාරියේ ඉංජිනේරුවරයෙකු ලෙස වසර පහ (05) ක ක්‍රියාකාරී පළපුරුද්දක් තිබිය යුතුය.

**III.** **තෝරා ගැනීමේ විශේෂ නිර්ණායක**

කාර්ය සාධන ඇගයීම සතුටුදායක මට්ටමක තිබිය යුතුයි.

සටහන : **ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස ඉංජිනේරු කවුන්සිලයේ ලියාපදිංචිය අනිවාර්යය වේ.**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියළුම නීතිරීති වලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළ යුතු වේ.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි දිවයිනේ ඕනෑම පෙදෙසක හෝ අධිකාරියේ ඕනෑම කොට්ඨාශයක/ අංශයක සේවය කිරීමට බැඳී සිටී.

ආදර්ශ ආකෘතිපත්‍ර ප්‍රකාරව සකසන ලද අයදුම්පත් 2024-12-05 වෙනි දින හෝ ඊට පෙර ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) වෙත ලැබෙන සේ අදාළ කොට්ඨාශ/ අංශ ප්‍රධානියා මගින් එවිය යුතු වේ. ඒ සමඟ අධ්‍යාපන හා වෘත්තීය සහතිකවල පිටපත්ද අමුණා එවිය යුතු අතර, අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් හා මෙම දැන්වීමේ අවශ්‍යතාවයන්ට සෑම අයුරින්ම අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

නියමිත දිනෙන් පසුව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රමාදවීමට තුඩුදුන් කරුණු අදාළ කොට්ඨාශ ප්‍රධානීන් විසින් සඳහන් කළයුතු අතර, එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)**

2024-11- 21 වන දින
මානව සම්පත් කොට්ඨාශයේදී ය.